# ජීවිතය පැකට් කරලා දෙන්න පුළුවන් බව ඔබ දන්නවාද ?

මහ රෑ දොළහට පමණ ප්‍රසව හා නාරිවේද වාට්ටුවට, ප්‍රාදේශීය රෝහලකින් ගෙන ආවා ප්‍රෙශර් තිබ්බ සති 39 පමණ ගර්භණී අම්මා කෙනෙක්. ඒ ගෙනා ස්ට්‍රෙචර් ඒකේ ලේ ගංගාවක් ගලලා තිබුනා. අපි දැක්ක ගමන් දැනගත්තා අපිට තියෙන අභියෝගය මොකක්ද කියලා.

ඒ අම්මාට සංකූලතා බොහොමයක් තිබුනා, වැඩිමහළු කම , ප්‍රෙශර් සහ ගිය වර දරු උපත සිසේරියන් සැත්කමකින් සිදු කර තිබුනා. ඒ ඔක්කොම එක්ක, ඕ නෙගටිව් කියන රුධිර ඝණය තිබුනේ. මිනිත්තු කිහිපයක් ඇතුලත සොයා ගත්තේ කුසේ දරුවා මිය ගොස් ඇති වග. සති තිස් හතෙන් රෝහල්ගත වෙන්නට සැලසුමක් දීලා තිබුනත් ඒ අම්මා සුපුරුදු පරිදි ගමේ ඉඳලා , මහ රෑ ලේ වහනය වෙන්න ගිය නිසා ප්‍රාදේශීය රෝහලට ගිහින්. මම ඇයට අම්මාගේ තත්වය හිතුවට වඩා හරිගියා. රුධිර වහනය නැවතුනා.... . අයිසීයූ එකට දැම්මා. උතුරු පළාතේ ඉන්නා ඕ නෙගටිව් රුධිර දායකයින් බොහෝ අය මහ පා න්දර ලේ දෙන්න ඇවිත් තිබුනා. ඒ අය අන් කවුරුවත් නෙමේ, ත්‍රිවිධ හමුදා වල සෙබළුන්. (එහෙම රෙජිස්ට්‍රියක් තියෙනවා. ඔවුන් බොහෝමයක් ඕනෙම වෙලාවක ලේ දෙන්න සූදානමින් ඉන්නේ )

ඒ වෙද්දි රතු සෛල පැකට් 15 කට වඩා දීලා තිබ්බා අනික්වා නම් ඉතා විශාල ප්‍රමාණයක්.

මේවගේ අත් දැකීම් නම් ටොන් ගණනක් තියෙනවා.ඇසිල්ලකින් ජීවිත 4ක් බේරන්න ඔබ දෙන රුධිර පැකට් එකකින් පුළුවන. ඒකට හේතුව ඒ එක පැකට් එකකින් සංඝටක වෙන් කරලා පැකට් හතරක් හැ දෙන නිසා.

මගේ නෑදෑ පොඩි අක්කා මිය ගියෙත් දරු ප්‍රසූතියේදී අධික රුධිරවහනය නවත්වන්න බැරුව. දැන් අම්මා නැතුව හැදෙන දරුවට




වෛද්‍ය බෝධිනී සමරතුංග

දරුවා කුසේදීම මිය ගොස් බව කියද්දී ඇය කීවා දවස් දෙක තුනක් දරුවා දැඟලුවේ නැති බවත්.

ඇය සුදු මැලිව සිටියා. මුළු උතුරෙම රෝහල් වල තිබ්බ ඕ නෙගටිව් ලේ හොයා මහ රෑ දොළහට රෝහලේ ලේ බැංකුව මගින් මහා සංග්‍රාමයක් ලෑස්ති කරා. එසැනින් ශල්‍යාගාර සූදානම් කළා. ඒ වෙද්දිත් ඒ අම්මා ප්‍රසව සංකූලතාවයක් වන ඩී අයි සී හෙවත් disseminated intravascular coagulopathy යන රුධිරය කැටි නොගැසීමේ තත්වයට පත් වී තිබුනා. ඒකට බොහෝ හේතු තියෙනවා. සිසේරිය න් සැත්කම කරද්දිත් මළ දරුවා සමගම අතොරක් නැතුව පයිපයක් ඇරලා වගේ රුධිරය වහනය වන ගර්භාශය ඉවත් කරද්දිත්, නිර්වින්දක හෙවත් ඇනැස්තිසිස් වෛද්‍යවරයා රුධිර පැකට් හෙවත් රතු සරල, ප්ලාස්මාව, පට්ටිකා සැරෙන් සැරේ ඒ අම්මාගේ අත් දෙකේ තිබූ කැනියුලා ඔස්සේ ශරීරගත කරනවා.

සියලු විශාල වාහිනී මසා ගර්භාශය ඉවත් කළ අපි දැක්කේ කුස පුරාම ඇති සියලු තැන් වලින් රුධිරය වහනය වන අයුරුය. විශේෂඥ වෛද්‍යවරයා සහ මම, ගෝස් පැක් සහ කුඩා නාලිකා වලිනුත් රුධිර වහනය නවත්වන ද්‍රව්‍ය කුස පුරා අතුරා කුසේ කැපුම අත් වලින් දෙපැත්තෙන් තද කරගෙන හිටියා.

එහෙම කරන අතරේ විශේෂඥ වෛද්‍යවරයා පවසනවා "මම හිටියේ සුදු කොඩි පෙනි පෙනී" කියලා.
ඒත් උදේ පාන්දර හතර වෙනකොට ඒ වයස අවුරුදු පහයි.
මේ සතිය පුරාම මම මේ වගේ කතා ලියන්න හිතුවා. ඒකට හේතුව ජාතික රුධිර පාරවිලයන සේවයේ එම සේවා අඛණ්ඩව පවත්වාගෙන යන්නේ එහි රුධිර දායකයන් හෙවත් රුධිර පරිත්‍යාගශීලීන් නිසා.

ලෝකය පුරා මේ උතුම් මිනිසුන් සමරන්නේ ජුනි 14 වැනි දින. ඉතින් අපිත් ජාතික රුධිර මධ්‍යස්ථානය ලෙස අති උත්කර්ෂවත් ලෙස මේ සැමරුමට ලක ලැහැස්ති වෙනවා.

තමන්ගේ අත කටුවකින් සිදුරු කර ලේ පයින්ට් එකක් දන් දෙන්න එන අය මට පෙනෙන්නේ දෙවිවරුන් වගේ. එහෙම දායකයින් දුටු පළමු දින මා මේ කවිය ලියා තැබුවා.

නමක් නැති බෝසත්
පියාපත් නැති දෙව් පුත්
මිනිස් හදවත් රැගෙන
විටෙන් විට මෙහි එති
සිරුර විද රුහිරු බිඳු
මෙත් සිතින් දන් දෙති

නන්නාඳුනන ගතක
දන්න අඳුනන වෙන්න
බිසෙෂන් බිඳ එකතු වී
ආදරය දන් දුන්න
නන්නාඳුනන ගතක
හුස්ම පොද රැකදෙන්න
පියාපත් නොලද ඒ
දෙවි, මිනිස් රූ ගත්තු
නමක් නැති බෝසත්තු
ඇවිද යති එති මෙබිම
ජීවිතය පැකට් කර
මෙහි තබා පිට වෙති






නිමල් සේදර

## වෙඩි කෑ සැමියා ළඟ වැලපුණු ඇතින්නක්

මොනරාගල "ඇතිමලේ" අදත් අලි ඇතුන් ගහන ප්‍රදේශයකි. දුටුගැමුණු රජතුමා සිය සොහොයුරු 'තිස්ස' කුමාරයා ලවා සරු සාර කෙත් යායක් අස් වැද්දූ මේ පෙදෙස අද ඉඳහිට අතරින් පතර කෙරෙන හේන් ගොවිතැනට පමණක් සීමා වී තිබේ. ශ්‍රී ලංකාව එක්සේසත් කිරීමට ගැමුණු කුමරුන් ගත් වෙහෙසට අවශ්‍ය ආර්ථික ශක්තිය සකස් වූයේ මේ ප්‍රදේශයේය. සොහොයුරා කළ වගා කටයුතු බලන්නට ගිය ගැමුණු කුමාරයා ඇහැට පෙනෙන තෙක් මානයට අස්වද්දා ඇති කෙත් යාය දැක "ඇතිමල්ලී" දැන් ලක එක්සේසත් කරමු'යි පැවසීය. එදා පටන් මේ ප්‍රදේශය ''අතිමලේ'' බවට පත්විය.

මෙවන් ඓතිහාසික පුරා වෘතාන්තයකට පසුබිම් වූ ''ඇතිමලේ" අදත් හේන් ගොවිතැනට බරපතල හානි සිදුවන්නේ අලි ඇතුන්ගෙන්ය. වරක් ඇතිමලේට ගිය මට ඈත වනපෙතේ රූස්ස ගස් දෙබල් මත ඉදිවී තිබෙන හේන්වල පැල්පත් දක්නට හැකිවිය. තැනින් තැන බිම ඉදිකර තිබුණ පැල්පත් සුළඟින් විනාශ වූ කලෙක මෙන් පෙරළා දමා තිබුණි. ඒ අලි ඇතුන්ගේ හපන්කම් බව දැනගතිමි.

වගාව සඳහා වන සතුන්ට ඇති බිම් කොල්ල කා ගැනීමට මිනිසා ආරම්භ කළේ කෘෂි ශිෂ්ඨාචාරයක උපතක් සමඟය. එදා මෙදා අතරතුර වන සතුන් හා සමඟ කෙරෙන සටන් නිමක් නැත. ඇතිමලේ සිදුවූ මේ "අලි ඛේදවාචකය" ඒ සටනේ තවත් ඉතිහාස කතාවකි. මට මේ කතාව පවසන ලද්දේ විසි හත් හැවිරිදි තරුණයෙකු වන ආර්. ඇම්. ආරියදාසය.

ඇතිමලේ වනපෙතේ ආරියදාසලාගේ හේන ක් තිබුණේය. මේ හේන ප්‍රමාණයෙන් අක්කර 3ක් පමණ විය. මයියොක්කා සහ බඩ ඉරිඟු. කුරහන් වැනි ධාන්‍යවලින් හේන සරු විය. පැල් රැකීමට භාර වී තිබුණේ ආරියදා සටය. ආරියදාසගේ හේනට යාබද හේන කොටා තිබුණේ ගිරිගෝරිස් නැමැති තවත් තරුණයෙකි. ගිරිගෝරිස් එදා පැලේ සිටියේ තනිවමය. රාත්‍රියේ ඇති පාලුව මකාගන්නට පැල් කවි මඳවිය. සතුන් එළවීමට වරින්වර මතු කරන කෑ කෝ ගැසීම් වනපෙතෙන් ඇසෙයි.

ගිරිගෝරිස් ද සිටියේ රූස්ස ගසක් මත ඉදිකළ පැලකය. මැදියම් රැයේ තරම ගිරිගෝරිස්ට ඇසුනේ උඟරන් මයියොක්කා පඳුරු වලට පහර දෙන ශබ්දයකි. ඔහු අත අවාසනාවකට මෙන් "ටෝච් එළියක් ද" නොතිබුණේය. ශබ්දය දෙසට කන් යොමු කළ ඔහු හරියටම තම පැල පාමුල සිටින සතකු පිළිබඳ සේයාවක් දුටුවේය. ඒ කුළු මීමෙක් වන්නට ඇතැයි සිතූ ඔහු ගස් දෙබලකට තබා තුවක්කුවේ කොකා ගස්සුවේය.

වෙඩි හඬ පළාත දෙවනත් කරත්ම ඒ හඬ යටපත් කරමින් මතුවූයේ අලියෙකුගේ බෙරහින් දීමය. සිදුවූ කාරිය ගිරිගෝරිස්ට වැටහුනේ දැන්ය. මොහොතකින් ඔහුට අවබෝධ වූයේ තවත් අලියකු එතන සිටින බවය. වෙඩි පහර වැදුනු අලියා එතැන වැටී සිටිනු ගිරිගෝරිස් දැක ඇත. අනික් අලියා විලාප නගමින් පැල ඉදිවී තිබුණු ගසට පහර දෙන්නට පටන් ගත්තේය.

අලින්ගේ විලාප හඬත්, වෙඩි හඬත්, යාබද පැලේ සිටි ආරියදාසටත් ගුණපාලටත් ඇසුණේය. ඒ සමඟම ගිරිගෝරිස් විලාප දෙන්නට විය.

"මාව බේරගනියෝ...... අලි ඇවිල්ලෝ....."
අරියදාස සහ ගුණපාල බැසගෙන විදුලි පන්දම්ද රැගෙන ගිරිගෝරිස්ගේ පැල දෙසට දිව ගියහ. එයට සමීපව තිබෙන කුඩා ගල් පව්වට ගොඩ වූ ඔවුහු බිම වැටී සිටින අලියාත් අනික් අලියාත් පැහැදිලිවම දුටුහ.

පැල තිබුණු ගසට පහර දෙමින් සිටි අලියා ටෝච් එළිය දෙසට එළවාගෙන එන්නට විය. අපි හනික ඈතට දුවගෙන ගොස් ගසකට නැගගෙන අලියා බිය ගන්වන්නට දන්නා තරමින් කෑගසන්නට වීමු.

අලියා අප සිටි දෙසට එලවාගෙන පැමිණි අවස්ථාවේ කඩිනමින් ගසෙන් බැසගත් ගිරිගෝරිස් තරමක් ඈතට දිවගොස් වෙනත් ගසකට නැග ගත්තේය. ආරිය දාසලා තවමත් ගස උඩ සිට අලියාව බිය ගැන්වීමට වෙර දරති. මේ අතර ගිරිගෝරිස්ගෙන් පණිවිඩයක් ආවේය.

"මං පැලෙන් බැස්සා කෑ ගහන්න එපෝ."

වටින් ගොඩින් එළිය වැටෙන්නට විය. ගහ මුළ වැටී සිටින අලියා තාමත් වේදනාවෙන් දඟලයි. ඒ අසල තාමත් අනික් අලියා රැඳී සිටී. වියරුවෙන් මෙන් දඟලන මේ සද්දන්තයා අලියෙක් නොව ඇතින්නක් බව දැනගත්තේ හොඳටම එළිය වැටුණු පසුය.

හිරුට බිය වී සිය ආදරවන්තයා හැර යන්නට තරම් ඇතින්න දුබල නොවූවාය. ගිරිගෝරිස් සහ ආරියදාසලාට වනයෙ පක හුරු පුරුදු තැනකි. ඔවුන් මේ පුවත ගම්වැසියන්ටත් ග්‍රාම සේවකටත් සැළ කළහ.

ගැමියෝ වනපෙතේ ඈතට වී මේ පෙම්වතුන් දෙස බලා සිටියහ. මහ දවල් ද ඇතින්න අලියා හැර ගියේ නැත. වෙඩි කා බිම වැටී සිටින අලියාගේ සිරුර වටා උකුස්සන් සහ මස් කන කුරුල්ලන් කැර කෙන්නට පටන් ගත්තේ දෙවෙනි දවසේදීය. ඇතින්න කුරුල්ලන් පසුපස පන්න පන්නා පහර දෙන්නට වෙහෙසුණාය. සිය ආදර වන්තයා මිය යාමටත් පෙර ඔහුගේ මස්වල රස බලන්නට පැමිණි කුරුල්ලන්ට ඉඩ දීමට ඇය දුර්වල නොවූවාය.

ඇතින්න එතැනින් එළවීමට ගත් වෙහෙස අසාර්ථක විය. ඇතැම් විටක වනපෙතට වදින ඇතින්න තවත් මොහොතකින් පෙරලා පැමිණියාය.

ඇදවැටී සිටින සිය සැමියා අසල දින තුනක් මුළුල්ලේ රැකවල් කල ඇයට සැමියා විඳින දුක තවදුරටත් දරගෙන සිටින්නට නොහැකි වන්නට ඇත. තුන්වෙනි දවසේදී ඇතින්න සදාදරණීය සැමියාගෙන් සමුගෙන වනය පතරට වැදුණාය. ඇය සමුගත් පසු වෙඩි කෑ අලියාටත් පරලොව දොරගුලු විවර විය.

මේ වනාහි ආහාරය සඳහා වන සතුන් සහ මිනිසුන් අතර පවතින සදාතනික අරගලයේ තවත් දුක්බර පිටුවක් පමණි.